ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**University of Sri Jayewardenepura**

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**External Degrees and Extension Courses Unit**

---

# 18 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය

## උපාධි ලෝගුව/ සාටකය/ හිස්වැස්ම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම

2025 ජනවාරි 11 වන දින පැවැත්වීමට නියමිත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 18 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය සැසිවාර 4 කින් පැවැත්වේ. එයට අදාළව උපාධි ලෝගුව/ සාටකය/ හිස්වැස්ම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම 2025.01.04 සහ 2025.01.05 යන දෙදින තුළ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේදී සිදු කෙරේ.

**පැමිණිය යුතු ලිපිනය :-** බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, අංක 616,හයිලෙවල් පාර, ගංගොඩවිල, නුගේගොඩ.

(විජේරාම මංසන්ධියේ මහජන බැංකුව ඉදිරිපිට සිට නුගේගොඩ දෙසට මීටර් 50 ක් දුරින් පිහිටා ඇත.)

පහත දැක්වෙන සබැඳියට පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය “V” රහිතව යෙදීමෙන් උපාධි ප්‍රදානෝත්සවයේ ඔබට අදාළ සැසිය හා පෙරහැර අංකය ලබා ගැනීමට හැකියාව ඇත. උපාධි ලෝගුව/ සාටකය/ හිස්වැස්ම හා ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම සඳහා ඔබ පැමිණිය යුතු දිනය, වේලාව සහ කණ්ඩායම ද එමඟින් ලබා ගත හැකිය.

- උපාධි ලෝගුව/ සාටකය/ හිස්වැස්ම හා ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට පැමිණෙන විට ඔබගේ ජාතික හැඳුනුම්පත හා ශිෂ්‍ය වාර්තා පොත රැගෙන ඒම අනිවාර්යය වේ.
- උපාධිලාභියා හැර වෙනත් අයෙකු විසින් උපාධි ලෝගුව/ සාටකය/ හිස්වැස්ම හා ප්‍රවේශ පත්‍ර ලබා ගන්නේ නම් ඊට අදාළ විස්තර පත්‍රිකාව පුරවා උපාධිලාභියාගේ කැමැත්ත ප්‍රකාශ කළ ලිපියක් සමඟ උපාධිලාභියාගේ ජාතික හැඳුනුම්පත හා ශිෂ්‍ය වාර්තා පොත රැගෙන ආ යුතුය.

18 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය සාර්ථක කර ගැනීම සඳහා ඉහත දක්වා ඇති උපදෙස්වලට අනුව කටයුතු කිරීමෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

2024-12-31